## දිවුල් *(Limonia acidissima L.)*

Family – RUTACEAE

09 – 10 m පමණ උස රළු කටු සහිත පොතු ඇති විශාල වෘක්ෂයකි. 5 – 7 mm පත්‍රිකා දිග 25 – 35 mm සහ පළල 10 – 20 mm වන පැහිරි සුවඳකින් යුක්ත පත්‍ර ඇත. සුදු/මෙරුන් පැහැති පෙති පහක් ඇති පුෂ්ප ඇත. පැණි රස හෝ ඇඹුල් රස ඵල දැඩි ඵලාවරණයක් සහිත ඵල ඇත. පිටතින් කොළ පැහැයට හුරු දුඹුරු පැහැයෙන් දිස්වෙන අතර ඇලෙන සුළු දුඹුරු පල්ප් සහ කුඩා සුදු බීජ අඩංගු වේ. පළතුරු පෙනුමෙන් Bael පළතුරු (Aegle marmelos) වලට සමාන යි. ප්‍රරෝහණය බීජ හා දඬු මඟින් සිදු වේ. බීජ ව්‍යාප්තිය සඳහා සතුන් සහය වේ.

ඉංග්‍රීසි නම් – Wood Apple, Elephant Apple, Monkey Fruit.

වෙනත් නම් – ගිවුල්, ජීවුල්, මායුරුක, ජුල්, දදඵල, තිරාමාළු, තිරාමිස, බුලත්තිය, මන්මථ, කචිජුරා, නරිවිල, විලාමරම්, හෙමන්ථනාථ, ස්වාදුපත්‍ර, සුරභිගන්ධිකා, සුමනඵල, සුඵල, සුගන්ධිකා, වෘත්තඵල, රංගිණී, මුබදූෂණ, මාලූර, මංගල්‍ය, ඵණගන්ධ, කපිත්ථ, දධිඵල, දධ්‍යාහ්ව, සුරභිච්ඡද, ග්‍රාහින්, ගන්ධඵල, චිරපාකී, කඨිනඵල, පුෂ්පඵල, කපිප්‍රියා, දන්තඵල, දන්තශඨ, අක්ෂ ව ප්‍රමෝදනී, අක්ෂශෂ්‍ය, ජටා, ආමගුප්තා, ආවෘත්ත, ඖදර්යය, කඨිනඵල, කණ්ඩුර, කපිත්ථපත්‍රා, කපිත්ථඵල, කපිරෝමඵල, කපිෂ්ට, කපීතණ, කළු, කබන්ධ, කම්ට්ටය, කරඤ්ජල, කරණ්ඩපල, කරහවල්ලභ, කරල, කවිට්ටෝ, කවිත්ථ, කුවඵල, ක්‍රිමිශස්ත්‍ර, බරපාව්‍ය, බරපදාඪ්‍ය, ගුඩඵල, ග්‍රාහිඵල, ගුප්ත, ගෝපති, ග්‍රන්ථිඵල, චණ්ඩා, චිත්‍රපත්‍රිකා, චිරපාකී, තක්‍රභිත්, දෝෂපාචන, මර්කටි, ලිංගක

ප්‍රයෝජ්‍ය අංග– පොතු, මුල්, පත්‍ර, මැලියම්

ගුණ කර්ම – රස – මධුර, අම්ල
ගුණ – ගුරු, ස්නිග්ධ
වීර්යය – ශීත
විපාක – මධුර
කර්ම – වාත, පිත්ත, ශාමක

ප්‍රයෝග – සංග්‍රාහි, විෂඝ්න, හෘද්‍ය, ශ්වාස, මූත්‍රා දෝෂ, හික්කා, කාස

## ඉඹුල් *(Bombax ceiba L.)*

Family - MALVACEAE

ඉංග්‍රීසි නම– Silk cotton tree

වෙනත් නම් – රක්ත ශාල්මලී ,ශාල්මලී

ප්‍රයෝජ්‍ය අංග – පොතු, මුල්, පත්‍ර, මැලියම්

රස – තික්ත කටු
ගුණ – ලඝු ,ස්නිග්ධ, පිච්ඡිල
වීර්යය – උෂ්ණ
විපාක – කටු
කර්ම – වාත පිත ශාමක අතිසාර පාචනය ස්ත්‍රී (ගර්භාෂ ගත)රෝග, අක්මාව හා ප්ලීහාව ආශ්‍රිත රෝග

ඉඹුල් මැලියම්
රස – මධුර, කෂාය
ගුණ – ලඝු, ස්නිග්ධ, පිච්ඡිල
වීර්යය – ශිත
විපාක – මධුර
කර්ම – කළු පිත ශාමක මළභේද්‍ය යි. ශුක්‍ර හා කළු වර්ධනය කරයි.රක්ත පිත්තය නසයි.

අතිසාරය පාචනය ආහාර ජීර්ණ පද්ධතිය ආශ්‍රිත රුධිර වහනය වීමේ තත්ත්වයන්. ප්ලීහා, ගුල්ම, විෂ, ආනාහ, මළබද්ධය, වේදනා සමනය කරයි.